# ආරක්ෂාකාරීව පළිබෝධනාශක යෙදීම

පළිබෝධනාශක යනු පළිබෝධකයින් මරා දැමීම සහ වෙනත් ආකාරයකින් පාලනය කිරීම සඳහා යොදා ගන්නා ද්‍රව්‍ය වේ. පළිබෝධනාශක ප්‍රධාන කාණ්ඩ 3 කි. - කෘමි නාශක, දිලීර නාශක, වල් නාශක පළිබෝධනාශක පළිබෝධකයන්ට මෙන්ම මිනිසාටද විෂ සහිත වේ.

මිනිස් ශරීරයට පළිබෝධනාශක ඇතුලුවීමෙන් දීර්ඝකාලීන රෝග ආබාධවලට මෙන්ම මරණයටත් පත්විය හැක.


පළිබෝධනාශක ශරීරයට ඇතුලුවන මාර්ග:

1. **සම මගින් -** සුලබවම ඇතුලුවන මාර්ගයයි. මිශ්‍ර කරන, වගාවන්ට යොදන හා පළිබෝධනාශක යෙදීමෙන් පසු වගාවන්හි කටයුතු කරන අවස්ථාවලදී තැවරීම සහ සුළඟ සමඟ ගසාගෙන එන බිඳිති සමේ ගැටීම නිසා

2. **නාසය මගින් -** සුළඟ සමග ගසාගෙන එන බිඳිති සහ වාෂ්ප ආශ්වාස කිරීමේදී පෙනහළු වලට ඇතුළුවීම නිසා

3. **ඇස් මගින් -** සුළඟ සමග ගසාගෙන එන බිඳිති, පරිහරණය කරනවිට විසිරෙන බිඳිති, අධි පීඩන වාෂ්ප ඇසෙහි ගැටීම නිසා

4. **මුඛය මගින් -** පළිබෝධනාශක තැවරුනු අත් පිරිසිදු නොකර ආහාරපාන ගැනීම, පළිබෝධනාශක යොදන අතරතුර දුම් පානය කිරීම නිසා




**ශරීරයේ සංවේදී ස්ථානවලින් පළිබෝධනාශක උරාගැනීමේ සාපේක්ෂතාව (ලිංගික ප්‍රදේශයෙන් ඒකක 100 ලෙස සලකා)**

## පළිබෝධනාශක ආරක්ෂිතව භාවිත කරන්නේ කෙසේද?

මේ සඳහා අවස්ථා 3 කදී අවධානය යොමු කළ හැක.

1. යෙදීමට පෙර සිදු කල යුතු දේවල්
2. යෙදීම අතරතුර සිදු කල යුතු හා නොකල යුතු දේවල්
3. යෙදීමෙන් පසු සිදු කල යුතු හා නොකල යුතු දේවල්

## යෙදීමට පෙර සිදු කල යුතු දේවල්

1. නිතරම විෂ බැවින් අඩු නිශ්පාදන තෝරා ගැනීම. උදා: පළිබෝධනාශක කොළ < නිල් < කහ < රතු ආකාරයට ක්ෂීරපායින්ට විෂ බවෙහි වැඩිවීම අනුව කාණ්ඩ කර ඇති බැවින් කොළ වර්ණ කාණ්ඩයට අයිති පළිබෝධනාශක නිෂ්පාදන තෝරාගැනීමට ප්‍රමුඛත්වය ලබාදීම.

2. නිවැරදි භාවිතය පිළිබඳ දැනුවත් වීම. උදා: හොඳින් ලේබලය කියවීම, නැත්නම් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරියෙකුගේ සුදුසු උපදෙස් ලබා ගැනීම.
3. පළිබෝධකයා සඳහා නිර්දේශිත නිෂ්පාදන පමණක් තෝරා ගැනීම.

4. ඉසින යන්ත්‍රය ක්‍රමාංකනය කර ගැනීම.

5. හදිසි අවස්ථාවකදී අවශ්‍ය වූ විට, ප්‍රථමාධාර දෙන ක්‍රම පිලිබඳ දැනුවත් වීම.

6. යොදන පළිබෝධනාශකය අනුව සුදුසු නොසලය තෝරා ගැනීම.( පහත රූපය බලන්න)


| පළිබෝධනාශයකයේ ආකාර | Reflex nozzle | Flat fan | Hollow cone |
|---|---|---|---|
| වල් නාශක සහ සංස්ථානිකව ක්‍රියාකාරී දිලීරනාශක | ✔ | ✔ | ⊖ |
| ස්පර්ශ ක්‍රියාකාරී දිලීරනාශක සහ කෘමිනාශක | ✓ | ✔ | ✔ |
| ස්පර්ශ ක්‍රියාකාරී දිලීරනාශක සහ කෘමිනාශක | ⊖ | ✓ | ✔ |



### යෙදීම අතරතුර සිදු කල යුතු හා නොකල යුතු දේවල්

1. ආරක්ෂිත ඇදුම් කට්ටලය නිසි ආකාරයට පැළැද සිටීම (පහත රූපය බලන්න.)
2. සුළං හමන දිශාවට ලම්භකව සහ පිටුපසට ගමන් කරමින් පලිබෝධනාශක යෙදීම.
3. පලිබෝධනාශක යොදන අතරතුර ආහාරපාන ගැනීම, දුම් බීම, සිදු නොකල යුතු අතර අවශ්‍ය විට හොඳින් සබන් යොදා දෑත් පිරිසිදු කර අවශ්‍යතාවය ඉටු කර ගැනීම.

## ආරක්ෂිත ඇදුම් කට්ටලය




### යෙදීමෙන් පසු සිදු කල යුතු හා නොකල යුතු දේවල්

1. යෙදීමෙන් පසු සියලුම ආරක්ෂිත ඇඳුම් සහ අනෙකුත් සියළුම ඇගළුම් ඉවත්කර සබන් ගා ජලයෙන් සෝදා පිරිසිදු කිරීම.
2. මිනිත්තු 15 ක් පමණ ගලායන ජලයෙන් ඇග පිරිසිදු කර ගැනීම. (පිරිසිදු කිරීමේදී සම තදින් ඇතිල්ලීමෙන් වැලකී සිටීම.)
3. පලිබෝධනාශක යෙදූ දිනය, යෙදූ පලිබෝධනාශකය, බෝගය, පලිබෝධකයා ආදී තොරතුරු ක්‍රමානුකූලව සටහන් තබා ගැනීම (පසු අවස්ථාවලදී මෙම තොරතුරු ප්‍රයෝජනවත් විය හැක.)

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ ජපාන ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය එක්ව ක්‍රියාත්මක කරන ශ්‍රී ලංකාව තුළ පලිබෝධනාශක හා පොහොර ආරක්ෂිතව හා නිවැරදි ලෙස භාවිතය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය මගින් සකසන ලදී

2025 නොවැම්බර්